පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய காணம்
DEPARTMENT OF EDUCATION - NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 12 |

# තෙවන වාර පරීක්ෂණය -2023

## තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය ( 1 )

පාසලේ නම - ............................................................ ඇතුළත්වීමේ අංකය - ....................

කාලය - පැය 02

========================================================

- වඩාත් සුදුසු වරණය තෝරන්න.

1. නිගාමී ක්‍රමයට අනුව සප්‍රමාණ නිගමනයක් ලබා ගැනීමේදී අදාල තර්කයෙහි අවයව,
   1) සත්‍ය විය යුතුය. 2) අසත්‍ය විය යුතුය. 3) සත්‍ය වීම අත්‍යවශ්‍ය නොවේ.
   4) සත්‍ය හෝ අසත්‍ය විය යුතුමය. 5) අසත්‍ය වීම අත්‍යවශ්‍ය නොවේ.
2. ඇරිස්ටෝටලියානු තර්ක ක්‍රමය
   1) ඇගයුම් රහිත එකකි. 2) චතුස්කෝටික තර්ක ක්‍රමයකි.
   3) තෙඇගයුම් හෙවත් ත්‍රිකෝටික තර්ක ක්‍රමයකි. 4) භාව්‍යතා රාශියක් ඇති එකකි.
   5) දෙඇගයුම් තර්ක ක්‍රමයකි.
3. ස්වභාවික විද්‍යාවන්,
   1) ජීව විද්‍යාව , රසායන විද්‍යාව , භෞතික විද්‍යාව 2) ජීව විද්‍යාව , රසායන විද්‍යාව , භූගෝල විදයාව
   3) මානව විද්‍යාව , රසායන විද්‍යාව , භෞතික විද්‍යාව 4) මානව විද්‍යාව , ආර්ථික විද්‍යාව , භෞතික විද්‍යාව
   5) භාෂා ශාස්ත්‍ර , ආර්ථික විද්‍යාව , භෞතික විද්‍යාව
4. 
   - ත්‍රිකෝණයකට කෝණ 3 ක් ඇත.
   - උත්සාහය ඇත්නම් ජය ලැබේ.
   - පේරාදෙණියේ විශ්ව විද්‍යාලයක් ඇත.
   - ඔහු එක්කෝ තේ බොයි නැත්නම් කෝපි බොයි.
   - ඔහු තේ මෙන්ම කෝපිද බොයි.

   මෙම ප්‍රස්තුත අනුපිළිවෙළට දැක්වෙන වරණය ,
   1) විශ්ලේෂී , සෝපාධික , සංශ්ලේෂී, වියෝජක , සංයෝජක
   2) විශ්ලේෂී , සෝපාධික , සංශ්ලේෂී, සංයෝජක, වියෝජක
   3) විශ්ලේෂී , සෝපාධික , වියෝජක , සංශ්ලේෂී, සංයෝජක
   4) සෝපාධික , විශ්ලේෂී , වියෝජක , සංයෝජක, සංශ්ලේෂී
   5) වියෝජක , විශ්ලේෂී , සෝපාධික , සංශ්ලේෂී, සංයෝජක
5. සිහින දැකීම පිළිබඳව මනෝ විද්‍යාව තුළ පාලිත කණ්ඩායම් පරීක්ෂණ පැවැත්වූ මනෝ විද්‍යාඥයා,
   1) පැව්ලොව් 2) වොට්සන් 3) වුන්ඩ්ට් 4) ඩෙමන්ට් 5) ෆ්‍රොයිඩ්
6. සංවාක්‍යයක කේන්ද්‍රිය කාර්යභාර්යයක් ඉටු කරන පදය කුමක්ද?
   1) නිගමනයේ වාච්‍ය පදය 2) මධ්‍ය පදය 3) පක්ෂ පදය
   4) නිගමනයේ වාචක පදය 5) සාධ්‍ය පදය
7. සාමාන්‍ය ප්‍රතිජානන හා සාමාන්‍ය නිශේධන ප්‍රස්තුතයන්ට පොදු ලක්ෂණයක් වන්නේ,
   1) ඒවායේ වාච්‍යය ව්‍යාප්ත අර්ථයකින් පැවතීම.
   2) ඒවා නිගමන ප්‍රස්තුතයක් හැටියට නොපිහිටීම.
   3) ඒවායේ වාච්‍යය ව්‍යාප්ත වන අතර වාචකය අව්‍යාප්ත වීමයි.
   4) ඒවයේ වාච්‍යය වාචක දෙකම ව්‍යාප්ත වීමයි.
   5) ඒවා නිතරම සාධ්‍ය අවයවය හැටියට පිහිටීමයි.
8. විවාහකයා - වැන්දඹුව යන්න,
   1) ප්‍රත්‍යනිකය 2) විසංවාදී වේ. 3) ප්‍රත්‍යනික මෙන්ම විසංවාදී වේ.
   4) ප්‍රත්‍යනික නොවේ. 5) ප්‍රත්‍යනිකවත්, විසංවාදීවත් නොවේ.

9. "සියලු සම්මාන වටින සිහිවටන වන නමුත් ඒවා අලෙවි කරන්නේ නැත.එහෙයින් සමහර වටිනා සිහිවටන අලෙවි කරන්නේ නැත." මෙම තර්කය වර්ග තර්ක ශාස්ත්‍රයට අනුව සංකේත කරන්නේ,

1) $A\bar{B} = \emptyset$, $A\bar{C} \neq \emptyset$, $\therefore B\bar{C} \neq \emptyset$

2) $A\bar{B} = \emptyset$, $A\bar{C} = \emptyset$, $\therefore B\bar{C} \neq \emptyset$

3) $A\bar{B} = \emptyset$, $A\bar{C} \neq \emptyset$, $\therefore B\bar{C} \neq \emptyset$

4) $A\bar{B} = \emptyset$, $AC \neq \emptyset$, $\therefore B\bar{C} \neq \emptyset$

5) $AB \neq \emptyset$, $A\bar{C} \neq \emptyset$, $\therefore B\bar{C} \neq \emptyset$

10. ආනුභූතික නොවන විද්‍යාවන්ට පදනම් වන්නේ,
1) තර්කය 2) බුද්ධිය 3) තර්කය හා බුද්ධිය 4) ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය 5) බුද්ධිය හා ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය

11. විද්‍යාත්මක උපන්‍යාසයක ලක්ෂණයක් වන්නේ,
1) සංදිග්ධතාවයෙන් යුක්තය. 2) පුනර්වාචකයකි. 3) සරලය.
4) අස්ඵුටතාවයෙන් යුක්තය. 5) අධිභෞතිකය.

12. ආනුභූතික පරීක්ෂණයේ ස්වරූපය මත එහි ප්‍රධාන ප්‍රභේද වන්නේ.
1) නිරීක්ෂණය හා නිර්ණය පරීක්ෂණය 2) ඍජු පරීක්ෂණය හා නිරීක්ෂණය 3) සම්පරීක්ෂණය හා වක්‍ර පරීක්ෂණය
4) නිරීක්ෂණය හා සම්පරීක්ෂණය 5) නිරීක්ෂණය හා වක්‍ර පරීක්ෂණය

13. මුලින්ම දුරදක්නය නිපදවන ලද්දේ,
1) ගැලීලියෝ 2) ලිපර්ෂි හැන්ස් 3) ලයිසෙන්කෝ 4) ෆ්‍රැන්සිස් ක්‍රික් 5) විලියම් කොක්

14. පුස්තකාලය යන පදය අයත් පද වර්ගය,
1) ඒකවාචී 2) වෛකල්‍යවාචී 3) පොදු සාමූහික 4) ඒකවාචී සාමූහික 5) ප්‍රතිජානන

15. බෞද්ධ තර්ක ක්‍රමය.
1) මනාව සංස්ථිතික වූවකි. 2) දෙඇගයුම් තර්ක ක්‍රමයකි. 3) ඇගයුම් රහිත වූවකි.
4) චතුස්කෝටික තර්ක ක්‍රමයකි. 5) ත්‍රිකෝටික තර්ක ක්‍රමයකි.

16. ඇගයුම්ශිලි විද්‍යාවන් පමණක් සඳහන් වන වරනය කුමක්ද?
1) ආචාර විද්‍යාව, සංගීතය, මනෝවිද්‍යාව 2) සංගීතය , නර්තනය , ගණිතය
3) නර්තනය , ගණිතය , සාහිත්‍යය 4) සංගීතය,පාරභෞතික විද්‍යාව , සාහිත්‍යය
5) ආචාර විද්‍යාව, සංගීතය, සාහිත්‍යය

17. ප්‍රත්‍යක්ෂ පරීක්ෂණය වඩාත් සාර්ථක ප්‍රතිඵල ලබා දෙන විෂයයක් වන්නේ,
1) ආර්ථික විද්‍යාව 2) දේශපාලන විද්‍යාව 3) මානව විද්‍යාව 4) අධ්‍යාපන මනෝ විද්‍යාව 5) ආචාර විද්‍යාව

18. විද්‍යාත්මක විප්ලවයක් ලෙස කුන් හඳුන්වන්නේ,
1) පදනම්වාද බිඳ වැටීම. 2) යම් ශාස්ත්‍රයක් පදනම් වාද පූර්ව අවස්ථාවක පසුවීම.
3) ක්ෂේත්‍රයේ පර්යේෂකයන්ට මග පෙන්වන වාදයක් බිහිවීම. 4) නව පදනම් වාදයක් බිහිවීම.
5) යම් අධ්‍යයන ක්ෂේත්‍රයක් මුහුකුරා ගිය විද්‍යාවක් බවට පත්වීම.

19. අනුගාමී පදනම් වාද දෙකකි.
1) සූර්ය කේන්ද්‍රවාදය හා ගුරුත්වාකර්ෂණවාදය 2) ප්ලොජිස්ටන්වාදය හා ඔක්සිකරණවාදය
3) පෘථිවි කේන්ද්‍රවාදය හා ගුරුත්වාකර්ෂණවාදය 4) ප්ලොජිස්ටන්වාදය හා ඕපපාතික ජනනවාදය
5) සූර්ය කේන්ද්‍රවාදය හා සාපේක්ෂතාවාදය

20. අන්වීක්ෂයසොයා ගත් තැනැත්තා,
1) ලුවී පාස්චර් 2) ඇන්ටනී ලියුවෙන්හෝ 3) විලියම් හාවි 4) ජෝන් ඉක්ලස් 5) පීටර් මෙඩවර්

21. සෑම සාමාන්‍ය පදයකම,
1) ගුණාර්ථයක් නැත. 2) වස්තු අර්ථයක් නැත. 3) ගුණාර්ථයක් ඇත.
4) වියුක්ත බවක් ඇත. 5) ගුණාර්ථයවත්, වස්තු අර්ථයවත් නැත.

22. සෙල්සියස් $100^0$ දී ජලය වාෂ්ප වේ යන්න,
1) විද්‍යාත්මක නොවේ. 2) ව්‍යාජ ප්‍රකාශයකි. 3) විද්‍යාත්මක ප්‍රකාශයකි .4) අසත්‍ය වූවකි. 5) නිවැරදිය.

23. $AB \neq \emptyset$
$\underline{A\bar{C} = \emptyset}$ මෙම තර්කය වෙන්රූප සටහන් අනුව සප්‍රමාණවීමට නම් නිගමනය විය යුත්තේ,

1) $B\bar{C} \neq \emptyset$ 2) $B\bar{C} \neq \emptyset$ 3) $B\bar{C} = \emptyset$ 4) $BC \neq \emptyset$ 5) $C\bar{B} = \emptyset$

24. ප්‍රස්තුත ප්‍රතියෝගය සම්බන්ධව කවර ප්‍රකාශය සාවද්‍යද?
1) I සහ O අතර උප ප්‍රත්‍යනික ප්‍රතියෝගය යෙදේ. 2) A සත්‍ය වන විට I සත්‍ය වේ.
3) O අසත්‍ය වන විට A සත්‍ය වේ. 4) විසංවාදී ප්‍රතියෝගය එකවර සත්‍ය නොවන නමුත් එකවර අසත්‍ය වේ.
5) A සහ E අතර ප්‍රත්‍යනික ප්‍රතියෝගය යෙදේ.

25. ඇරිස්ටෝටල්ට අනුව සප්‍රමාණ වූ උප ප්‍රකාර වෙන් රූප සටහන් අනුව නිෂ්ප්‍රමාණ වීමට හේතුව,
1) අවයව හා නිගමන අතර නොගැළපීම. 2) සත්භාවය පිළිබඳ ආභාසය.
3) අවයව හා නිගමන සියල්ලම එකම ප්‍රස්තුත වර්ගයකට අයත් නොවීම. 4) කවයන් තුළ කතිරයක් නැතිකම.
5) සර්වවාචී ප්‍රස්තුතවල වාචකයට පැවැත්මක් නැතිකම.

26. සප්‍රමාණ සංවාක්‍යය අවයවයක් විශේෂ වේ නම් නිගමනයද විශේෂ විය යුතුය යන උප රීතියට අනුව පිහිටිය හැකි අවස්ථා නිවැරදිව දැක්වෙන වරණය.

| | | | | |
|---|---|---|---|---|
| 1) A A I I E | 2) E E I A I | 3) O E A I A | 4) I E A O A | 5) A I A O E |
| I O E O I | I O E I A | E O I A O | E I O A I | I A O A I |

27. සමහර වංචනිකයෝ මෝඩයන් වෙති නම් සමහර වංචනික නොවන්නන් මෝඩයන් නොවේ යන්න,
1) අයථා පරිවර්තනයකි. 2) අයථා පරස්ථාපනයකි. 3)අයථා ප්‍රතිවර්තනයකි.
4) සප්‍රමාණ ප්‍රතිවර්තනයකි. 5) අයථා ප්‍රතිලෝමනයකි.

28. විද්‍යාඥයෙකුගේ ක්‍රියා මාර්ගයේ තාර්කික ස්වරූපය , අසත්‍ය වන අනාවැකි මගින් උපන්‍යාස අසත්‍ය කිරීම නොහොත් බහිෂ්කරණය කිරීමයි යන්න අදාල වන විධික්‍රමය,
1) උද්ගමනවාදය 2) නිගාමී සත්‍යෝක්ෂණවාදය 3) සාපේක්ෂකවාදය
4) නිගාමී අසත්‍යකරණවාදය. 5) පර්යේෂණ වැඩ සටහන් ක්‍රමය

29. ප්‍රමාණයෙන් සමාන,ගුණයෙන් අසමාන ප්‍රස්තුත වන්නේ ,
1) A I සහ E O 2) I E සහ O A 3) A,I 4) A E සහ I O 5) E O සහ A I

30. පරමාදර්ශී සම්පරීක්ෂණයක් පවත්වන්නේ නම්,
1) සාධක පාලනයක් නොකළ යුතුය. 2) සාධකයක් පාලනය කළ යුතුය.
3) වරකට එක් සාධකයක් පමණක් විචලනය කළ යුතුය. 4) ඍජු ලෙසම ගුණාංගයක් පාලනය කළ යුතු ය.
5) ගැටලුවේ ස්වරූපය මත පරීක්ෂණය සිදුකළ යුතු ය.

31. ඉතිහාසය හැදෑරීමේදී යොදා ගන්නා ලේඛනගත හැදෑරීමක් වන්නේ,
1) ප්‍රශ්නමාලා පරීක්ෂණ 2) සම්මුඛ පරීක්ෂණ 3) ප්‍රත්‍යක්ෂ ඉතිහාස හැදෑරීම.
4) නඩු වාර්තා හා පොලිස් වාර්තා 5) නිර්ණය පරීක්ෂණ.

32. අගහරුගේ කක්ෂය ඉලිප්සාකාර බව සොයාගැනීමට කෙප්ලර්ට සහාය වූයේ,
1) කොපර්නිකස්ගේ සොයා ගැනීම් ය. 2) ගැලීලියෝගේ සොයා ගැනීම් ය. 3) ආකිමිඩිස්ගේ නියමයන්ය.
4) ඇරිස්ටෝටල්ගේ වාර්තා ය. 5) ටයිකෝ ද බ්‍රාහේගේ වාර්තා ය.

33. අභීත සෙන්පතියෙකි.
අභීත පුරුෂයෙකි.
ඒ නිසා සියලු පුරුෂයන් සෙන්පතියන් ය.
මෙම තර්කය වර්ග තර්ක ශාස්ත්‍රයට අනුව සංකේත කළ විට නිවැරදි සංකේතකරණය වන්නේ,

1) $\chi \in A$, $\chi \in B$, $\therefore B\bar{A} = \emptyset$
2) $\chi \in \bar{B}$, $\chi \in A$, $\therefore A\bar{B} = \emptyset$
3) $\chi \notin B$, $\chi \in A$, $\therefore A\bar{B} = \emptyset$
4) $\chi \in \bar{A}$, $\chi \in B$, $\therefore A\bar{B} = \emptyset$
5) $\chi \in B$, $\chi \notin A$, $\therefore A\bar{B} = \emptyset$

34. නියමයක අන්තර්ගත ලක්ෂණය මින් කුමක්ද?
1) ඍජු පරීක්ෂණ මගින් සනාථ කළ හැකි වීම. 2) වක්‍ර පරීක්ෂණ මගින් සනාථ කළ හැකි වීම
3) ක්ෂේත්‍රය පුළුල් වීම. 4) අසත්‍යකරණයට ලක් වීමට වැඩි ඉඩක් පැවතීම.
5) එකම සිද්ධියක් සම්බන්ධයෙන් නියම රාශියක් පැවතීම.

35. පරීක්ෂකවරයා පරීක්ෂණයෙහි දත්තයක් බවට පත්වෙමින් කරනු ලබන පරීක්ෂණය .......................
1) ප්‍රත්‍යක්ෂ පරීක්ෂණය 2) නිර්ණය පරීක්ෂණය 3) සහභාගී පරීක්ෂණය
4) සමාජ මිතික පරීක්ෂණයයි. 5) පාලිත කණ්ඩායම් ක්‍රමයයි.

36. " පොළොව විශ්වයේ මැද පිහිටි ගෝලාකාර නොසෙල්වී ඇති වස්තුවකි.හද , හිරු , ග්‍රහලෝක හා තරු වටා වෘත්තාකාර මාර්ගයක ගමන් කරයි." මෙම මතය ඉදිරිපත් කළේ ?
1) ඇරිස්ටෝටල් 2) ඉයුඩොක්සස් 3) ටොලමි 4) පිල්ලෝස් 5) පයිතගරස්

37. තර්ක ශාස්ත්‍රයේ ක්‍රමානුකූල දියුණුවක් ඇති වන්නේ,
1) ක්‍රි.පූ 4 වන සියවසේ සිට ය. 2) 19 වන සියවසේ සිට ය. 3) 20 වන සියවසේ ය.
4) 16 වන සියවසේ සිට ය. 5) 17 වන සියවසේ සිට ය.

38. භාරතීය තර්ක ශාස්ත්‍රයේ එන ස්වාර්ථ අනුමානයේ කොටස් නිවැරදිව අන්තර්ගත වන පිළිතුරු පහත කවරක්ද?
1) ප්‍රතිඥා, හේතු උදාහරණ , උපනය, නිගමනය 2) සාධ්‍ය, පක්ෂ,හේතු,ව්‍යාප්ති 3) සාධ්‍ය, පක්ෂ, මධ්‍ය
4) ප්‍රතිඥා, හේතු උපනය, නිගමනය 5) සාධ්‍ය, පක්ෂ, උදාහරණ , නිගමනය

39. පහත සඳහන්ඒවායින් ප්‍රත්‍යනීක පද යුගලය කුමක්ද?
1) කීකරු -අකීකරු 2) පළමුවැනියා - අන්තිමයා 3) ශ්‍රී ලාංකික - විදේශික 4) ගුරු - ගෝල 5) යාන - වාහන

40. පහත සඳහන් එවායින් විශ්ලේෂී අසත්‍යය ප්‍රස්තුතය කුමක්ද?
1) සමහර ආගන්තුකයෝ පිටස්තරයෝ නොවේ. 2) මහවැලි ගඟ ත්‍රිකුණාමලයෙන් මුහුදට වැටෙයි.
3) " A" යන්න " A" වේ. 4) චතුරස්‍රයට පැති 4ක් ඇත.
5) සිව්පාවා වනවාසී සතෙකි.

41. පහත සඳහන් ඒවායින් විද්‍යාඥයාගේ කාර්යය නොවන්නේ,
1) විද්‍යාත්මක ගැටළු වලට විසඳුම් ලබා දීම. 2) සංවිධිතාවියන් ඉදිරිපත් කිරීම. 3) නව සංකල්ප ගොඩනැගීම.
4) අනාවැකි ප්‍රකාශ කිරීම. 5) ගවේෂයන්හි පවතින තර්ක ක්‍රම හැදෑරීම.

42. අනාවැකි අසත්‍යය වන හැමවිටම උපන්‍යාස අසත්‍ය ලෙස බැහැර නොකිරීම කුමන විධික්‍රමයක දුර්වලතාවයක් දැක්වීමට යොදා ගන්නක්ද?
1) නිගාමී සත්‍යාක්ෂණවාදී විධික්‍රමය. 2) උද්ගමනවාදී විධික්‍රමය 3) සාපේක්ෂකවාදී විධික්‍රමය.
4) නිගාමී අසත්‍යකරණවාදී විධික්‍රමය 5) පර්යේෂණ වැඩසටහන් විධික්‍රමය.

43. පහත දැක්වෙන දෑ අතුරෙන් සුනිෂ්පන්න සූත්‍රයක් වන්නේ කුමක්ද?
1) $\sim P \rightarrow Q$ 2) $( P \rightarrow Q)$ 3) $P \rightarrow Q \rightarrow R$ 4) $(P \wedge Q) \rightarrow R \wedge S$ 5) $(P \vee Q) \rightarrow R \wedge S$

44. ප්‍රධාන චින්තන නියම තුන හඳුනවා දුන්නේ,
1) ලයිබ් නිට්ස් 2) පයිතගරස් 3) නිව්ටන් 4) ඇරිස්ටෝටල් 5) සොක්‍රටීස්

45. එකම විද්‍යා ක්ෂේත්‍රයක් තුළ තරගකාරී උපන්‍යාස කීපයක් ගොඩනැගී ඇති විටක ඉන් නිවැරදි උපන්‍යාසය තෝරාගැනීමේ පරීක්ෂණය,
1) පාලිත කණ්ඩායම් පරීක්ෂණය 2) නිර්ණය පරීක්ෂණය 3) සම්මුඛ පරීක්ෂණය
4) සහභාගී නිරීක්ෂණය 5) ප්‍රත්‍යයක පරීක්ෂණය

46. නළ දරු උපත් සමඟ ගැටෙන දෙයකි,
1) නීතිරීති 2) ආගමික ඉගැන්වීම්. 3) සදාචාරය 4) වෛද්‍ය පර්යේෂණ 5) කලාව

47. ප්‍රස්තුත ප්‍රතියෝගයට අනුව සැබෑ ලෝකයේ නොපවතින දේ පිළිබඳව සාකච්ඡා කිරීමේදී මතුවන ගැටලු,
1) න රූපික ආභාසය 2) න ගම්‍යතෙ ආභාසය 3) යදෘච්ඡා ආභාසය
4) අස්ථිවාචී ආභාසය 5) සාධ්‍යසම ආභාසය

48. හේතු සාධක සහිත පදනමක් ඇති ප්‍රකාශ වන්නේ,
1) සිද්ධිවාචක ප්‍රකාශ 2) පුනර්වාචක ප්‍රකාශ 3) ප්‍රාමාණික ප්‍රකාශ 4) ඇගයුම්ශීලී ප්‍රකාශ 5) ආත්මීය ප්‍රකාශ

49. ආචාර විද්‍යාව , සංගීතය ,නර්තනය යන විෂයයන් ,
1) සමාජයීය විද්‍යා 2) විස්තරාත්මක විද්‍යා 3) ක්ෂුද්‍ර විද්‍යා 4) ව්‍යවහාරික විද්‍යා 5) ඇගයුම්ශීලී විද්‍යා

50. චින්තනය පිළිබඳව හැදෑරුවද එහි සප්‍රමාණතාවය පිළිබඳ හදාරන්නේ නැති විෂයය.
1) දර්ශනය 2) ආචාර විද්‍යාව 3) මනෝවිද්‍යාව 4) මනෝචිකිත්සක විද්‍යාව 5) තර්ක ශාස්ත්‍රය

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய காணம்
DEPARTMENT OF EDUCATION - NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 12 |

තෙවන වාර පරීක්ෂණය -2023

# තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය ( 11 )

පාසලේ නම - ............................................................ ඇතුළත්වීමේ අංකය - .................

කාලය - පැය 03

=====================================================

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.11,111 කොටස්වලින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගනිමින් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.( පළමු ප්‍රශ්නය ඇතුළුව පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ප්‍රමාණය 6 කි.)

## 1 කොටස

1.

I. ප්‍රස්තුතයක් යන්න අර්ථ දක්වන්න.
II. "දරුවන් පමණක් අහිංසක වේ" යන්න වර්ගතර්ක ක්‍රමයට අනුව සංකේතකර දක්වන්න.
III. මධ්‍යතන යුගයේ යුරෝපයේ පැවති ඥාන සම්ප්‍රදා දෙක කවරේද?
IV. රේඩියම් සොයාගැනීමේ ගෞරවය හිමිවන්නේ කාටද?
V. "රාමා හෝ රාවණා සීතාට ආදරය කළේ නම් එවිට ලක්ෂ්මන් සීතාට ආදරය කළේ නැත යන්න අසත්‍ය ය. " යන ප්‍රකාශය සංදිග්ධ සේ සළකා එය සංකේත කළහැකි ආකාර දෙක ලියා දක්වන්න.
VI. ප්‍රස්තුත ප්‍රතියෝගය ඇසුරෙන් ගොඩනැගෙන සද්භාවය පිළිබඳ ආභාසය යනු කවරේද?
VII. ප්‍රස්තුතයක සත්‍ය අසත්‍ය තාව තීරණය කරන ආකාර දෙක කවරේද?
VIII. ගණිතමය සම්පරීක්ෂණය යනු කවරේද?
IX. ප්‍රමේයයක් යන්න අර්ථ දක්වන්න.
X. ගුරුත්වාකර්ෂණවාදය ලොවට හඳුන්වා දුන්නේ කවුරුන්ද?

( ලකුණු 2× 10 = 20)

## 11 කොටස

2. අ) අව්‍යවහිත අනුමානයෙහි ලා ගැනෙන පරිවර්තනය යන්න අර්ථ දක්වා A ,E,I යන ප්‍රස්තුත වල පරිවර්තන අවස්ථා නිදසුන් මගින් දක්වන්න.

( ලකුණු 06 )

ආ) පහත තර්ක ආනයන රීති ඇසුරින් සප්‍රමාණ වේද , නිශ්ප්‍රමාණ වේද යන්න දක්වන්න.නිශ්ප්‍රමාණ වන විට ඇති වන ආභාසය ද දක්වන්න.

I. සියලු කාන්තාවන් සංවේදී අය වෙති.එහෙයින් සමහර සංවේදී අය කාන්තාවන් වේ.
II. සමහර වෙළෙන්දන් කපටි අය වෙති.එම නිසා කිසිම වෙළෙන්දෙක් කපටි අයෙක් නොවන්නේ නොවේ.
III. ඇතැම් දේශපාලඥයෝ බුද්ධිමත් අය නොවෙති.එහෙයින් ඇතැම් බුද්ධිමත් නොවන්නන් දේශපාලඥයන් වේ.
IV. කිසිම භාණ්ඩයක් මිල අධික නොවේ.එහෙයින් ඇතැම් භාණ්ඩ නොවන ඒවා මිල අධික වේ.
V. සියලු රටවල් සාමකාමී වේ.එහෙයින් සමහර සාමකාමී නොවන ඒවා රටවල් නොවන්නේ වේ.

( ලකුණු 2× 5 = 10 )

3. අ) පහත සඳහන් තර්ක සප්‍රමාණ ද නිශ්ප්‍රමාණද යන්න සංවාක්‍ය රීති මගින් නිර්ණය කරන්න.යම් හෙයකින් තර්කයක් නිශ්ප්‍රමාණ වේ නම් බිඳී ඇති රීතිය/රීති , සිදුව ඇති ආභාසය/ආභාස සඳහන් කරන්න.

I. විද්‍යාඥයින් පමණක් පර්යේෂණ පවත්වති.පර්යේෂණ පවත්වන්නන් පමණක් නිවැරදි තීරණ වලට එළඹෙන අය වෙති. එහෙයින් විද්‍යාඥයෝ නිවැරදි තීරණ වලට එළැඹෙන අය වෙති.

II. සියලු විදේශිකයෝ සංචාරකයෝ වෙති.කිසිම සංචාරකයෙක් කම්මැලි නොවෙති.එහෙයින් කිසිම විදේශිකයෙක් කම්මැලි නොවෙති.එහෙයින් කිසිම කම්මැලි අයෙක් සංචාරකයෙක් නොවේ.

III. සියලු දක්ෂ ළමයි බුද්ධිමත් අය වෙති.ඇතැම් ළමයි ක්‍රියාශීලී අය වෙති.එහෙයින් සියලු ක්‍රියාශීලී අය දක්ෂ අය වෙති.

IV. සියලු ගස් ප්‍රයෝජනවත් ය. සියලු පොත් ප්‍රයෝජනවත් ය. එම නිසා ගස් පොත් ය.

( ලකුණු 02 × 4 = 08)

ආ)

I. විශේෂ ප්‍රස්තුත දෙකක් අවයව ලෙස පිහිටන විට සප්‍රමාණ නිගමනයකට යා නොහැක්කේ මන් ද? නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

II. O ප්‍රස්තුතයක් පරිවර්තනය කළ නොහැක්කේ මන්දැයි පරිවර්තන රීති ඇසුරෙන් දක්වන්න.

( ලකුණු 04 × 2 = 08)

4. අ) පහත සඳහන්තර්ක සංකේතයට නගා ඒවා සප්‍රමාණ ද නිශ්ප්‍රමාණ ද යන්න වෙන්රූප සටහන් මගින් නිගමනය කරන්න.

I. කිසිම ලේඛකයෙක් පොහොසත් නොවේ.සියලු වාර්තාකාරයෝ පොහොසත් ය. එම නිසා කිසිම වාර්තාකාරයෙක් ලේඛකයෙක් නොවේ.

II. සියලු විදේශ ගමන් බලපත්‍රධාරීහු ගුවන් තොටුපලට ප්‍රවේශ විය.ආරක්ෂක නියාමක විදේශ ගමන් බලපත්‍රධාරියෙකු නොවේ.එමනිසා ආරක්ෂක නියාමක ගුවන් තොටුපළට ප්‍රවේශ නොවීය.

III. සියලු නීතිසම්පාදකයෝ පුරවැසියෝය.සියලු මන්ත්‍රීවරු පුරවැසියෝ ය.එම නිසා සියලු මන්ත්‍රීවරු නීති සම්පාදකයෝ ය.

IV. සියලු අවතාර ලතෝනි දෙති.සියලු අවතාර සුරංගනාවියෝ ය. එම නිසා සමහර සුරංගනාවියෝ ලතෝනි දෙති.

( ලකුණු 03 × 4 =12 )

ආ) වර්ග ඡේදනය ශූන්‍ය වර්ගය නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

( ලකුණු 06 )

5. අ) කාල් පොපර්ගේ අසත්‍යකරණවාදී විධික්‍රමයෙහි ප්‍රධාන අදහස් දක්වා, එහි ඇති ගැටළු මොනවාදැයි පැහැදිලි කරන්න.
ආ) තෝමස් කූන්ගේ සුසමාදර්ශී පදනම්වාදය , සාමාන්‍ය විද්‍යා අවධිය හා විද්‍යාත්මක විප්ලවය යන සංකල්පවල ලක්ෂණ නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

6. අ) ( 1) ඔබේ සංක්ෂේපණ රටාව පැහැදිලිව දක්වමින් පහත දැක්වෙන වාක්‍ය සංකේත භාෂාවට පරිවර්තනය කරන්න.
ඉදින් කලාව සහ සංගීතය යන දෙකෙන් එකක් හා එකක් පමණක් ජීවිතයට සතුට ගෙනෙන්නේ නම් එවිට නර්තනය ජීවිතයට සතුට ගෙනෙන්නේ නැත.

(11) දී ඇති සංක්ෂේපණ රටාව උපයෝගී කරගෙන පහත සංකේත වාක්‍ය සිංහලයට පරිවර්තනය කරන්න.
P = ඔහු ආත්මාර්ථකාමීය
Q = ඔහු අනුන්ට උදව් කරයි.
R = ඔහු ව්‍යාපාර කටයුතු කරයි.
$((P \leftrightarrow Q) \sim (\sim Q \vee \sim R))$

ආ) පහත දැක්වෙන තර්ක සුදුසු සංක්ෂේපණ රටාවක් මගින් සංකේතයට නගා සත්‍යතා රුක් ක්‍රමය මගින්සප්‍රමාණ නිශ්ප්‍රමාණ බව විමසා බලන්න..

I. ඇය නිසිපරිදි උපදෙස් පිළිපදිමින් අභ්‍යාස කර ඇත්නම් ඇයට පදක්කම දිනාගත හැකි ය.ඇයට පදක්කම දිනාගත හැකිනම් එක්කෝ ඇය ජනප්‍රිය වේ.නැත්නම් ඇය ධනවත් වේ.එහෙයින් ඇය නිසිපරිදි උපදෙස් පිළිපදිමින් අභ්‍යාස කර ඇත්නම් හා එසේ නම් පමණක් එක්කෝ ඇය ජනප්‍රිය වේ නැත්නම් ඇය ධනවත් වේ.

II. මිනිසුන් නපුරු වන්නේ ඔවුන්ට සාධාරණයක් සිදු නොවන්නේ නම් පමණි.ඔවුනට සාධාරණයක් සිදු නොවන්නේ පාලකයින් අත්තනෝමතික නම් පමණි.පාලකයින් අත්තනෝමතික නොවන නමුත් මිනිසුන්ට සාධාරණයක් සිදු නොවේ.එහෙයින් මිනිසුන් නපුරු වේ.

## 111 කොටස

7. අ) විධික්‍රමයෙහි යෙදෙන ස්වභාවික නිරීක්ෂණය හා සම්පරීක්ෂණය අතර වෙනස පැහැදිලි කරන්න.
ආ) ස්වභාවික නිරීක්ෂණයේදී උපකරණ භාවිතා වේද? පැහැදිලි කරන්න.
ඉ) නිරීක්ෂණ දත්ත අප විසින් සකසන ඒවාය පැහැදිලි කරන්න.

8. පහත දැක්වෙන තර්ක සංකේතවලට නගා ඒවායේ නිගමන අවයව වලින් ව්‍යුත්පන්න කර ඒවා සප්‍රමාණ බව දක්වන්න.එක් එක් තර්කය සංකේතවලට නැගීම සඳහා ඔබ විසින් උපයෝගී කර ගන්නා සංක්ෂේපණ රටාව ලියා දක්වන්න.

I. ඉන්දියාව සහ පාකිස්ථානය යන රටවල් දෙකම මිත්‍රවිය නොහැකිය.ඉන්දියාව මිත්‍රය.එම නිසා පාකිස්ථානය මිත්‍ර නැත.

II. ඉදින් අධ්‍යාපනය මෙන්ම තාක්ෂණය දියුණු නම් මිනිසා දියුණු ය.එහෙයින් මිනිසා දියුණු නොවේ නම් එක්කෝ අධ්‍යාපනය දියුණු නොවේ.නැත්නම් තාක්ෂණය දියුණු නොවේ.

III. එක්කෝ ඔහු රෝහලට පිහිනා ගියේය නැත්නම් බෝට්ටුවෙන් ගියේය.ඔහු පිහිනා ගියේ නම් හෝ කුලී රථයෙන් ගියේ නම් ප්‍රමාද වී රෝහලට පැමිණි අතර සායනයද අතපසු විය.ඔහු ප්‍රමාද නොවීය.ඒ නිසා ඔහු බෝට්ටුවෙන් ගියේය.

IV. ඉදින් ඇ ආදර්ශ මෝස්තරකාරියක් වන්නී නම් එවිට ඇ ප්‍රචාරක විශේෂඥවරියක් වේ.ඉදින් ඇ ප්‍රචාරක විශේෂඥවරියක් වන්නී නම් එවිට එක්කෝ ඇ ප්‍රසිද්ධ වේ.නැත්නම් ඇ රුමත් වේ.එහෙයින් ඇ ප්‍රසිද්ධ වන්නේ නැත්නම් හා රුමත් වන්නේ නැත්නම් එවිට ඇ ආදර්ශ මෝස්තරකාරියක් වන්නේ වත්, ප්‍රචාරක විශේෂඥවරියක් වන්නේවත් නැත.

9. අ) පහත දැක්වෙන තර්ක සංකේතවලට නගා ඒවා සප්‍රමාණ වේද නිශ්ප්‍රමාණ වේද යන්න සත්‍ය වක්‍ර වක්‍ර ක්‍රමයෙන් විමසන්න.ඔබේ සංක්ෂේපණ රටාව ද ලියා දක්වන්න.

I. ඉදින් විද්‍යාලීය පිහිනුම් තටාකය වසා ඇත්නම් අපට පිහිනුම් පුහුණුවීමට නොහැකිය. අපට පිහිනුම් පුහුණුවීමට නොහැකි නම් තරගයෙන් පරාජය වේ.එම නිසා විද්‍යාලයීය පිහිනුම් තටාකය වසා ඇත්නම් තරගයෙන් පරාජය වේ.

II. ඉදින් ඉඩි අමීන් එක්කෝ නපුරුය.නැත්නම් ඒකාධිපති ය.ඔහු නරක නායකයෙකි.ඉදින් ඉඩි අමීන් නපුරු නම් එවිට ඔහු ඒකාධිපති නොවේ.එම නිසා එක්කෝ ඉඩි අමීන් නරක නායකයෙකු නොවේ.නැත්නම් ඔහු ඒකාධිපති ය.

ආ) ව්‍යුත්පන්න කිරීමෙන් පහත සඳහන් ප්‍රමේයය සාධනය කරන්න.

I. $(P \rightarrow Q) \rightarrow [(Q \rightarrow R) \rightarrow (P \rightarrow R)]$

II. $(P \rightarrow [(P \rightarrow Q) \rightarrow Q)]$

10. අ) වාදයක් නියමයකින් වෙන්කර හඳුනා ගැනීම සඳහා පෙන්නුම් කරන ලක්ෂණ කවරේද?
ආ) "විද්‍යාවේ දැනුම ගොඩනැගීම සිදුවන්නේ යම් නිශ්චිත වූ ක්‍රමවේදයකට අනුවය."
ඔබ එකග වන්නේද?හේතු දක්වන්න.
ඉ) උපන්‍යාසයක සරල බව යන්නෙන් කුමක් සඳහන් වේද ? උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.
උ) ප්‍රත්‍යක්ෂ පරීක්ෂණය යන්න නිදසුනක් ඇසුරෙන් දක්වන්න.

(ලකුණු 04 ×4 =16)

11. පහත සඳහන් හතරක් පිළිබඳ ලුහුඩු සටහන් ලියන්න.

I. සත්‍ය හා සප්‍රමාණතාව
II. ආනුභූතික විද්‍යා හා න.ආනුභූතික විද්‍යා
III. ප්‍රධාන සංවාක්‍ය ප්‍රකාර
IV. චින්තන නියම
V. ඉන්දීය තර්ක ක්‍රමය

( ලකුණු 04 ×4 =16)

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත

மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய காணம்

**DEPARTMENT OF EDUCATION - NORTH CENTRAL PROVINCE**

| ශ්‍රේණිය |
| --- |
| **12** |

**තෙවන වාර පරීක්ෂණය -2023**

## තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය 1 ( පිළිතුරු පත්‍රය )

| | | | |
| --- | --- | --- | --- |
| 01) | 1 | 26) | 1 |
| 02) | 5 | 27) | 5 |
| 03) | 1 | 28) | 4 |
| 04) | 1 | 29) | 4 |
| 05) | 4 | 30) | 3 |
| 06) | 2 | 31) | 4 |
| 07) | 1 | 32) | 5 |
| 08) | 2 | 33) | 1 |
| 09) | 1 | 34) | 1 |
| 10) | 3 | 35) | 3 |
| 11) | 3 | 36) | 2 |
| 12) | 4 | 37) | 2 |
| 13) | 2 | 38) | 2 |
| 14) | 3 | 39) | 2 |
| 15) | 4 | 40) | 1 |
| 16) | 5 | 41) | 5 |
| 17) | 4 | 42) | 1 |
| 18) | 1 | 43) | 2 |
| 19) | 2 | 44) | 4 |
| 20) | 2 | 45) | 2 |
| 21) | 3 | 46) | 3 |
| 22) | 3 | 47) | 4 |
| 23) | 4 | 48) | 1 |
| 24) | 4 | 49) | 5 |
| 25) | 2 | 50) | 3 |


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න